# ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## තනතුරු පුරප්පාඩු (රාගම / කරාපිටිය)

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ රාගම හා කරාපිටියේ පිහිටා ඇති වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකයන්හි පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම අවශ්‍ය වේ.

### 1. සාක්ෂි පටිගත කිරීමේ සහකාර MA 3 (තනතුරු 02)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මනෝ විද්‍යාව/ සමාජ විද්‍යාව/ ජන සන්නිවේදනය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

### 2. උපදේශන සහකාර MA 03 (තනතුරු 02)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මනෝ විද්‍යාව / සමාජ විද්‍යාව/ සෞඛ්‍ය ප්‍රවර්ධනය/ විශේෂ අවශ්‍යතා පිළිබඳ අධ්‍යාපනය/ කථන හා ශ්‍රවණ විද්‍යාව/ නාට්‍ය හා රංග කලාව පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

**වෙනත්**

**ඉහත 1 හා 2 තනතුරු සඳහා පොදු කරුණු :**

- **සේවා ගණය හා මාසික වැටුප් පරිමාණය :**

  ක.සේ.දෙ. චක්‍රලේඛ 2/2016 -MA 3 රු .[32,200-10 x 445-11 x 660-10 x 730-5 x 750 - 54,960.00]

  ක.සේ.දෙ. චක්‍රලේඛ 02/2016 උපලේඛන II අනුව 2020.01.01 වන දිනට ආරම්භක වැටුප් පියවර රු. 32,200.00
- **වයස** : අවුරුදු 23ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
- **බඳවා ගැනීමේ ක්‍රමවේදය** : පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ලිඛිත තරඟකාරී විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම සිදු කෙරේ.

### 3. වීඩියෝ තාක්ෂණික සහකාර MA 2-1 (තනතුරු 02)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික හෝ වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරනු ලබන NVQ ( ජාතික වෘත්තීමය සුදුසුකම්) 05 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම (වීඩියෝකරණය හා ඡායාරූපකරණය) සමඟ අදාළ ක්ෂේත්‍රයේ එක් වසරක පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.

**වෙනත්**

- **සේවා ගණය හා මාසික වැටුප් පරිමාණය :**

  ක.සේ.දෙ. චක්‍රලේඛ 02/2016 - MA 2-1 රු. [30,310 -10x300 – 7x350 – 4x 495- 20x 660 -50,940]

  ක.සේ.දෙ. චක්‍රලේඛ 02/2016 උපලේඛන II අනුව 2020.01.01 වන දිනට ආරම්භක වැටුප් පියවර රු. 30,310.00
- **වයස :** අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
- **බඳවා ගැනීමේ ක්‍රමවේදය** : පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ලිඛිත තරඟකාරී විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම සිදු කෙරේ.

### 4. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (යතුරු ලියන කටයුතු) සිංහල මාධ්‍ය MA 1-1 (තනතුරු 02)

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපනික**

1. a) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් එක්වරකදී පහත විෂයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම.
   - i. සිංහල
   - ii. ඉංග්‍රීසි භාෂාව
   - iii. ගණිතය

   b) අ.පො.ස.(උ/පෙළ) විභාගයෙන් විෂයන් තුනක් (03) (පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

   C) යතුරු ලියනය/ පරිගණක සාක්ෂරතාවය පිළිබඳ මාස හයක (06) සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික සේවා ගණයේ ශිල්පීය, අර්ධ ශිල්පීය සහ ශිල්පීය නොවන නිලධාරීන් හට අයදුම් කළ හැක.

**අධ්‍යාපනික**

a) අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් පහත විෂයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම.
- i. සිංහල
- ii. ඉංග්‍රීසි භාෂාව
- iii. ගණිතය

b) යතුරු ලියනය/ පරිගණක සාක්ෂරතාවය පිළිබඳ මාස හයක (06) සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

**වෙනත්** : ඉහත සේවා ගණයේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

### 5. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (යතුරුලියන කටයුතු) දෙමළ මාධ්‍ය MA 1-1 (තනතුරු 02)

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපනික**

1. a) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් එක්වරකදී පහත විෂයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම.
   - i. දෙමළ
   - ii. ඉංග්‍රීසි භාෂාව
   - iii. ගණිතය

   b) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් විෂයන් තුනක් (03) (පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

   C) යතුරු ලියනය/ පරිගණක සාක්ෂරතාවය පිළිබඳ මාස හයක (06) සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික සේවා ගණයේ ශිල්පීය, අර්ධ ශිල්පීය සහ ශිල්පීය නොවන නිලධාරීන් හට අයදුම් කළ හැක.

**අධ්‍යාපනික**

a) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් පහත විෂයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම.
- i. දෙමළ
- ii. ඉංග්‍රීසි භාෂාව
- iii. ගණිතය

b) යතුරු ලියනය/ පරිගණක සාක්ෂරතාවය පිළිබඳ මාස හයක (06) සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

**වෙනත්** : ඉහත සේවා ගණයේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායී සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

### 6. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (සෝදුපත් බැලීමේ කටයුතු) සිංහල මාධ්‍ය MA 1-1 (තනතුරු 02)

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපනික**

1. a) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් එක්වරකදී පහත විෂයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම.
   - i. සිංහල
   - ii. ඉංග්‍රීසි භාෂාව
   - iii. ගණිතය

   b) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් විෂයන් තුනක් (03) (පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික සේවා ගණයේ ශිල්පීය, අර්ධ ශිල්පීය සහ ශිල්පීය නොවන නිලධාරීන් හට අයදුම් කළ හැක.

**අධ්‍යාපනික**

a) අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් පහත විෂයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම.
- i. සිංහල
- ii. ඉංග්‍රීසි භාෂාව
- iii. ගණිතය

**වෙනත්** : ඉහත සේවා ගණයේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායී සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

### 7. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (සෝදුපත් බැලීමේ කටයුතු) දෙමළ මාධ්‍ය MA 1-1 (තනතුරු 02)

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපනික**

1. a) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් එක්වරකදී පහත විෂයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම.
   - i. දෙමළ
   - ii. ඉංග්‍රීසි භාෂාව
   - iii. ගණිතය

   b) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් විෂයන් තුනක් (03) (පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික සේවා ගණයේ ශිල්පීය, අර්ධ ශිල්පීය සහ ශිල්පීය නොවන නිලධාරීන් හට අයදුම් කළ හැක.

**අධ්‍යාපනික**

a) අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් පහත විෂයන් ඇතුළුව විෂයන් 04 කට සාම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම.
- i. දෙමළ
- ii. ඉංග්‍රීසි භාෂාව
- iii. ගණිතය

**වෙනත්** : ඉහත සේවා ගණයේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වෙනත්**

(ඉහත 4, 5 , 6 , හා 7 තනතුරු සඳහා පොදු කරුණු )

- සේවා ගණය හා මාසික වැටුප් පරිමාණය :

  ක.සේ.දෙ. චක්‍රලේඛ 02/2016 - MA 1-1 රු. [27,910 -10x300 –7x350 – 4x 495- 20x 660 – 48,540]

  ක.සේ.දෙ. චක්‍රලේඛ 02 /2016 උපලේඛන II අනුව 2020.01.01 දිනට ආරම්භක වැටුප් පියවර රු. 27,910.00
- **වයස** : අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
- **බඳවා ගැනීමේ ක්‍රමවේදය** : පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ලිඛිත තරඟකාරී විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම සිදු කෙරේ.

**ප්‍රතිලාභ**

ඉහත සඳහන් සියලු තනතුරු සඳහා මූලික වැටුපට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව හිමිවේ. එමෙන්ම සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% ක දායකත්වයක් හා සේවක භාරකාර අරමුදල සඳහා 3%ක දායකත්වයක් ද අධිකාරිය විසින් දරනු ලැබේ.

**පොදු කරුණු**

සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, විශිෂ්ට චරිතයකින් යුක්ත වීම හා තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

ඉහත තනතුරු සඳහා අයදුම් කිරීමට සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවියේ (**www. childprotection.gov.lk**) පළ කොට ඇති ආදර්ශ අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර 2021 අප්‍රේල් මස 12 වන දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් පමණක් පහත ලිපිනය වෙත යොමු කළ යුතුය.

සෑම අයදුම්කරුවකුම තම අයදුම්පත්‍රය සමඟ උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක්, ජාතික හැඳුනුම්පතේ/ විදේශ ගමන් බලපත්‍රයේ සහතික කළ පිටපතක් හා අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කළ හැකි සහතිකපත් වල සහතික කළ පිටපත්ද යොමු කළ යුතුය. යම් අයදුම්කරුවෙකු එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම් එම එක් එක් තනතුර සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් වෙනම ලිපිකවරවල බහා යොමු කළ යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමා අයදුම්කරන තනතුර සඳහන් කර එවිය යුතු අතර, රජයේ දෙපාර්තමේන්තු / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් යොමුකළ යුතුය.

ඉහත උපදෙස් අනුව ඉදිරිපත් කොට නොමැති, අසම්පූර්ණ හා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, මෙම තනතුර ලබා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත. කෙටි ලැයිස්තුගත කිරීමෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සහ /හෝ ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, මෙම පත්වීම් සම්බන්ධව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,**
**නො. 330, තලවතුගොඩ පාර,**
**මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර.**

**දුරකථන අංකය - 0112778911-14**
**වෙබ් අඩවිය - www.childprotection.gov.lk**